# SINHALESE A1 – STANDARD LEVEL – PAPER 2
# CINGALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 2
# CINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 2

Friday 23 May 2003 (afternoon)
Vendredi 13 mai 2003 (après-midi)
Viernes 13 de may de 2003 (tarde)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

## INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question only. You must base your answer on at least two of the Part 3 works you have studied. You may include in your answer a discussion of a Part 2 work of the same genre if relevant. Answers which are not based on a discussion of at least two Part 3 works, will not score high marks.

## INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- Ne pas ouvrir cette épreuve avant d'y être autorisé.
- Traiter un seul sujet de composition. Vous devez baser votre réponse sur au moins deux des œuvres de la 3e partie que vous avez étudiées. Le cas échéant, vous pouvez inclure dans votre réponse une discussion sur une œuvre du même genre littéraire étudiée dans la 2e partie du programme. Les réponses qui ne sont pas basées sur au moins deux des œuvres de la 3e partie n'obtiendront pas une note élevée.

## INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Elija un tema de redacción. Su respuesta deberá basarse en al menos dos de las obras estudiadas en la Parte 3. Se podrán hacer comentarios sobre una obra de la Parte 2 del mismo género, si fuera necesario. Las respuestas que no incluyan una discusión sobre al menos dos obras de la Parte 3 no recibirán notas altas.

2 පත්‍රය - රචනා ප්‍රශ්න

පහත සඳහන් මාතෘකා අතුරින් එකක් යටතේ වාක්‍ය රචනයක් ලියන්න. 3 වන කොටසේ දී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් යටත් පිරිසෙයින් දෙකක් වත් ඔබේ පිළිතුරට පදනම් විය යුතු ය. අදාළ නම් 2 වන කොටසේ ග්‍රන්ථ අතුරින් එම සාහිත්‍යාංගයටම අයත් කිසියම් කෘතියක් ගැන වුව ද පිළිතුරේ දී සාකච්ඡා කළ හැකිය. 3 වන කොටසින් යටත් පිරිසෙයින් ග්‍රන්ථ දෙකක් පිළිබඳ සාකච්ඡාවක් පදනම් කොටගෙන නොමැති පිළිතුරුවලට ඉහළ ලකුණු ගණනක් නොලැබෙනු ඇත.

සම්භාව්‍ය සාහිත්‍යය

1. එක්කෝ

(අ) ඔබ හදාරා ඇති සම්භාව්‍ය කෘති අතුරින් දෙකක් තෝරා ගෙන ඒවායේ ප්‍රධාන තේමාවන් හැටියට හඳුනාගත හැක්කේ මොනවාද යන්න සහ ඒවා ඉදිරිපත් කර ඇති ආකාරය සංසන්දනාත්මකව පිරික්සන්න.

නැතහොත්

(ආ) සම්භාව්‍ය සාහිත්‍යයේ පාඨකයාගේ අවධානය වඩාත් යොමු වන්නේ ආඛ්‍යානය වෙතය. ඔබ හදාරා ඇති කෘති දෙකක් සසඳමින් මේ කියමනෙහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

නාට්‍ය කලාව

2. එක්කෝ

(අ) “ගැටුමක් නොමැති තැන නාට්‍යයක්ද නොමැත” මේ කියමනෙන් අදහස් කෙරෙනුයේ කුමක් ද යන්න පැහැදිලි කොට, ඔබ හදාරා ඇති නාට්‍ය දෙකක් සසඳමින් මේ අදහසෙහි සත්‍යතාව පරීක්ෂා කරන්න.

නැතහොත්

(ආ) නාට්‍යයක චරිත නිරූපණයේ දි නාට්‍ය රචකයාට මුහුණ පාන්නට සිදුවන දුෂ්කරතා කවරේ ද යන්න නාට්‍ය කෘති දෙකක් සසඳමින් පරීක්ෂා කරන්න.

නවකථාව

3. එක්කෝ

(අ) ඔබ හදාරා ඇති නවකථා දෙකක් තෝරා ගෙන කථා රසය තියුණු කිරීම සඳහා ඒවායේ කතුවරුන් යොදා ගෙන ඇති උපක්‍රම සංසන්දනාත්මකව පරීක්‍ෂා කරන්න.

නැතහොත්

(ආ) සාහිත්‍ය කරුවා ස්වකීය ප්‍රධාන චරිතයන් කෙරෙහි දක්වන ආකල්පය නවකථාවක චරිත නිරූපණය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් විය හැකිය. ඔබ හදාරා ඇති නවකථා දෙකක චරිත නිරූපණය සසඳමින් මේ කියමන පරීක්‍ෂා කරන්න.

කාව්‍යය

4. එක්කෝ

(අ) ඔබ හදාරා ඇති කාව්‍ය නිර්මාණ අතුරින් කවීන් දෙදෙනෙකුගේ රචනාවන්හි ප්‍රධාන තේමාවන් හඳුනාගෙන ඒවා ප්‍රකාශ කිරීමට යොදා ගෙන ඇති රචනා උපක්‍රම සංසන්දනාත්මකව පරීක්‍ෂා කරන්න.

නැතහොත්

(ආ) දැඩි ආවේගයන් පාඨකයා තුළ ඉපදවීම සඳහා කවීන් යොදන උපක්‍රම කවරේදැයි හඳුනාගෙන, ඔබ හදාරා ඇති කාව්‍ය නිර්මාණ කිහිපයක් සසඳමින් එම උපක්‍රමයන්ගේ සාර්ථකත්වය ගණනය කරන්න.

කෙටි කතා

5. එක්කෝ

(අ) සාර්ථක කෙටි කතාවක් නිර්මාණය කිරීම සඳහා එහි කතුවරයා කවර ලක්‍ෂණ කෙරෙහි අවධානය යොමු කළ යුතුද යන්න හඳුනාගෙන, ඔබ කියවා ඇති කෙටි කතාවල මෙම ලක්‍ෂණ අන්තර්ගත වී ඇති ආකාරය සංසන්දනාත්මකව පිරික්සන්න.

නැතහොත්

(ආ) කෙටි කතාව යනු හුදෙක් කෙටියෙන් ලියන ලද කතා පුවතක් නොවේ. මෙම අදහස ඔබ කියවා ඇති කෙටි කතා ඇසුරින් පිරික්සන්න.

**පොදු ප්‍රශ්න**

6.

**එක්කෝ**

(අ) සාහිත්‍යය යනු සමාජ විවරණයෙකැයි යන අදහස ඔබ හදාරා ඇති සාහිත්‍ය ග්‍රන්ථවලින් තහවුරු වන්නේද? ඔබ හදාරා ඇති සාහිත්‍ය ග්‍රන්ථ දෙකක් සසඳමින් මේ කියමන පරීක්‍ෂා කරන්න.

**නැතහොත්**

(ආ) සාහිත්‍ය කෘතියක පාඨකයාගේ සිත් ඇද ගැනීම සඳහා යොදා ගත හැකි ප්‍රබල උපක්‍රමයක් නම් හාස්‍යයයි. ඔබ හදාරා ඇති සාහිත්‍ය කෘතිවලින් මේ අදහස තහවුරු කළ හැකිදැයි පරීක්‍ෂා කරන්න.

**නැතහොත්**

(ඇ) තාක්‍ෂණික වශයෙන් බලන විට ඕනෑම සාහිත්‍ය කෘතියක දුර්වල කොටස වනුයේ එහි අවසානයයි. ලේඛකයාට කිමට තිබුණු දේ මේ වන විට කියා නිමවී ඇති බැවිනි. මේ අදහසට ඔබ එකඟ වන්නේද?

**නැතහොත්**

(ඈ) ඔබ හදාරා ඇති සාහිත්‍ය ග්‍රන්ථ දෙකක වැදගත් අදහස් හැටියට හඳුනා ගත හැක්කේ මොනවාද? ඒවා ඉදිරිපත් කර ඇති ආකාරය හා පාඨකයා කෙරෙහි මෙකී අදහස බලපාන ආකාරය සංසන්දනාත්මකව පරීක්‍ෂා කරන්න.